පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.04.07 පැය 0700 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out / 667/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|

# පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

## 01. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්දන ඒකකය.

2025.04.06 වන දින උදෑසන කාලයේ මුල්ලේරියාව පොලිස් වසමේ හිඹුටාන ප්‍රදේශයේදී විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්දන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මුල්ලේරියාව පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත. ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 57 ක් වන පහල හිඹුටාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මුල්ලේරියාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. ගංජා හේනක් වැටලීම - පොලිස් විශේෂ කාර්ය බලකා හපුතලේ කඳවුර.

2025.04.06 වන දින උදෑසන කාලයේ හල්දුම්මුල්ල පොලිස් වසමේ බසදුලුදෙන රක්ෂිත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා හපුතලේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් **අක්කර ½ ක පමණ භූමි ප්‍රමාණයක වගා කර තිබූ ගංජා හේනක් වටලා** ඇත.

මෙම වැටලීමේදී අඩි දෙකක් පමණ උස ප්‍රමාණයෙන් යුතු ගංජා ගස් 3100 ක ප්‍රමාණයක් ගලවා විනාශ කර ඇත. මෙම ගංජා හේන පවත්වාගෙන ගිය සැකකරුවන් අත්අඩංගුවට ගැනිමට හල්දුම්මුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. නීති විරෝධී මත්පැන් සහ ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්දන ඒකකය.

2025.04.06 වන දින උදෑසන කාලයේ පමුණුගම පොලිස් වසමේ මුතුරාජවෙල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්දන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්පැන් ලීටර් 378 ක්, ගෝඩා ලීටර් 3683 ක්, තඹ දඟර 12 ක්, බැරල් 30 ක්, හා බූලි 12 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන පමුණුගම පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 64 ක් වන මුතුරාජවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පමුණුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි. වැටලීමට අදාල ජායාරූපයක් මේ සමග යොමු කරමි.

**04.** **බලපත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය කළ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරලංගවිල කඳවුර.**

2025.04.06 වන දින සවස් කාලයේ අරලංගවිල පොලිස් වසමේ නිදන්වල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා අරලංගවිල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීම් දෙකක් සිදුකර **බලපත්‍ර නොමැතිව ලොරි රථ දෙකකින් වැලි කියුබ් 06 ක් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු ලොරි දෙක ද සමඟ අත්අඩංගුවට** ගෙන අරලංගවිල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 21 වයසේ පසු වන නිදන්වල සහ මුරුතැන්ගේ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

අරලංගවිල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05.** **නීති විරෝධී දුම්වැටි තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරලංගවිල කඳවුර.**

2024.04.06 වන දින සවස් කාලයේ දෙහිඅත්තකණ්ඩිය පොලිස් වසමේ නවගම ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා අරලංගවිල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද දුම්වැටි 543 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන දෙහිඅත්තකණ්ඩිය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දෙහිඅත්තකණ්ඩිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06.** **නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2025.04.06 වන දින උදෑසන කාලයේ පමුණුගම පොලිස් වසමේ මුතුරාජවෙල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්පැන් ලීටර් 30 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන පමුණුගම පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන උස්වැටකෙයියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පමුණුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**